# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2453/22 - 2025 සැප්තැම්බර් මස 10 වැනි බදාදා - 2025.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.බී. 94/47 (IX)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය යටතේ වන නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති භූමි ප්‍රදේශයවන ‘‘කච්චිවත්ත පුරාණ විහාර (දීපදුත්තාරාමය) භූමි ප්‍රදේශය’’ නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(ආ) ‘‘කච්චිවත්ත පුරාණ විහාර (දීපදුත්තාරාමය) භූමි ප්‍රදේශය’’ සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ.

**අනුර කරුණාතිලක,**
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය.

2025 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### කච්චිවත්ත පුරාණ විහාර (දීපදුත්තාරාමය) භූමිය සංයුක්ත වන භූමි ප්‍රදේශය

දකුණු පළාතේ, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, (ග්‍රා. නි. ව. අංක 99) මාගාල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාගාල්ල ග්‍රාමයේ පිහිටි, සර්වේයර් ජනරාල්වරයාගේ 2025 ජූනි මස 03 වන දිනැති ජීජ්/ජීඑප්ජී/2024/769 දරන අනුරේඛනයේ කැබලි අංක 'ඒ' (හෙක්ටයාර 0.1777) සහ කැබලි අංක 'බී' (හෙක්ටයාර 1.0240) වශයෙන් නිරූපිත හෙක්ටයාර 1.2017 ක විශාලත්වයකින් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ භූමි ප්‍රදේශය :-

**කැබලි අංක 'ඒ' - (හෙක්ටයාර 0.1777)**

*උතුරට* : කඩඉම් සිතියම් අංක 810012 හි කලාප 3 හි පත්‍ර 1හි කැබලි අංක 134, කැබලි අංක 125 සහ කැබලි අංක 127;

*නැගෙනහිරට* : කඩඉම් සිතියම් අංක 810012 හි කලාප 3 හි පත්‍ර 1හි කැබලි අංක 127, කැබලි අංක 128 සහ කලාප 4 හි පත්‍ර 1හි කැබලි අංක 1;

*දකුණට* : කඩඉම් සිතියම් අංක 810012 හි කලාප 3 හි පත්‍ර 1හි කැබලි අංක 130 සහ මූලික පිඹුරු අංක 3254; සහ

*බටහිරට* : මූලික පිඹුරු අංක 3254 සහ කඉම් සිතියම් අංක 810012 හි කලාප 3 හි පත්‍ර 1හි කැබලි අංක 134,

**කැබලි අංක 'බී' - (හෙක්ටයාර 1.0240)**

*උතුරට* : කඩඉම් සිතියම් අංක 810012 හි කලාප 4 හි පත්‍ර 1හි කැබලි අංක 78, පත්‍ර 4 හි කැබලි අංක 2, කැබලි අංක 3 සහ කැබලි අංක 4 පත්‍ර 1හි කැබලි අංක 55, කැබලි අංක 57, කැබලි අංක 62, කැබලි අංක 67, කැබලි අංක 68, කැබලි අංක 72;

*නැගෙනහිරට* : කඩඉම් සිතියම් අංක 810012 හි කලාප 4 හි පත්‍ර 3 හි කැබලි අංක 125 සහ කඩඉම් සිතියම් 810012 හි කලාප අංක 5;

*දකුණට* : කඩඉම් සිතියම් අංක 810012හි කැබලි අංක 80, කැබලි අංක 81, කැබලි අංක 90, කැබලි අංක 91, කැබලි අංක 92, කැබලි අංක 102, කැබලි අංක 103, කැබලි අංක 104; සහ

*බටහිරට* : කඩඉම් සිතියම් අංක 810012 හි කලාප 4හි පත්‍ර 1 හි කැබලි අංක 1.

EOG 09 - 0084

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.